කාන්තාවන් ලිංගික වස්තූන් ලෙසින් දැක්වෙන ගතානුගතික ආකල්ප වර්තමානය වන විට වෙනස් වෙමින් පැවතීම සතුටට කරුණකි. කෙසේ නමුත්, තවමත් මාධ්‍ය තුළත්, ජනප්‍රිය සංස්කෘතිය තුළත්, කාන්තාව ලිංගික වස්තුවක් ලෙසින් දැක්වීමත්, ඒකාකෘතික කිරීමත්, පුවතක් භාවාතිශය ලෙසින් දැක්වීමට කාන්තා බාහිර රූපය යොදාගැනීමත් දක්නට ලැබේ.

එම පසුතලය ඔස්සේ, පහත පුවත් සිරස්තල හා එම පුවත් වාර්තා වී ඇති ආකාරය සලකා බලමු.

"ලක්ෂ 21 ක් කොල්ලකා සුරූපී ළඳුන් එක්ක සැප අරන්" - දිනමිණ (නොවැම්බර් 24, 2022)
"අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ගණිකා පාරාදීසයක්" - දිනමිණ (නොවැම්බර් 26, 2022)

මෙම පුවත් දෙකම ඉදිරිපත් කිරීම සඳහා, කාන්තාවකගේ යටිකය දැක්වෙන එකම ඡායාරූපයක් භාවිතා කර ඇත.

1) ඔබ සිතන ලෙසට, මෙම පුවත් දෙකම ඉදිරිපත් කිරීම සඳහා මෙවැනි ඡායාරූපයක් අත්‍යවශ්‍ය වේද? මෙම ඡායාරූපය මෙම පුවත් දෙකටම සෘජුව අදාළ වේ යැයි ඔබ සිතන්නේ ද?

2) මෙවැනි ඡායාරූපයක්, "සුරූපී ළඳුන්", "ගණිකා" වැනි යෙදුම් සහිත සිරස්තල සමඟින් ඉදිරිපත් කිරීම ඔස්සේ, පොදුවේ කාන්තාව ලිංගික වස්තුවක් ලෙසින් ඉදිරිපත් නොවන්නේ ද? එය කාන්තාව ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කොන් කිරීමක් ද නොවන්නේ ද?

3) "සුරූපී ළඳුන්" යනුවෙන් සිරස්තල යොදා ඇති නොවැම්බර් 24, 2022 දිනමිණ පුවතට, කාන්තා බාහිර ස්වරූපය අදාළ වේද? එසේ අදාළ නොවේ නම්, එය යොදා ඇත්තේ සිරස්තලයට භාවාතිශය බවක් එක් කිරීමට යැයි ඔබ නොසිතන්නේ ද? එය ද ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාන්තාව කොන් කිරීමක් නොවන්නේ ද?

4) "ගණිකාව" යන යෙදුම හා බද්ධ වී ඇති සමාජ ගර්හාවද සමඟින් බැලූ විට, "ලිංගික ශ්‍රමික" වැනි යෙදුමක් වඩාත් උචිත නොවන්නේ ද?

මූලාශ්‍ර:
[http://image.guardian.co.uk/.../05/29/joiningupthedots.pdf](http://image.guardian.co.uk/.../05/29/joiningupthedots.pdf)
[https://esource.dbs.ie/.../10788/341/ba_hogan_k_2012.pdf...](https://esource.dbs.ie/.../10788/341/ba_hogan_k_2012.pdf...)
[https://www.veriteresearch.org/.../the-objectification.../](https://www.veriteresearch.org/.../the-objectification.../)